## <u>යක්ෂ ගෝත්‍රික බෙරය පංසලට ඇතුල්වීම</u>

යක් බෙරය පමණක් නොව ගැට බෙරය ආදී වෙනත් බෙර වර්ග ගැන ද මෙරට සංගිතඥයන්ගේ නිසි අවධානය යොමු වී ඇතැයි කිව නො හැකි ය. විශේෂයෙන් ම එහි සම්භවය පිළිබඳ අධ්‍යයනයක් කළ යුතු වෙයි. බෙරය ආර්යයන්ගේ සංගිත භාණ්ඩයක් නොවිණි යැයි කියැවෙයි. බෙර වර්භ තම සංගීතයෙහි ලා යොදාගත්තෝ බොහෝ විට අනාර්යයෝ ය. මෙහි දී ද අවධාරණය කළ යුත්තේ අනාර්ය නමින් ආර්ය නොවන සියල්ලන් ම හැඳින්වෙන බව ය. අප්‍රිකානුවෝ ද ඒ අරුතින් ගත්කල අනාර්යයෝ වෙති. විවිධ අප්‍රිකානු බෙර වර්ග ඇති බව ද අද යුරෝපීයයන් මේ ඇතැම් බෙර තම සංගීතයෙහි යොදා ගන්නා බව ද අමතක නොකළ යුතු ය.

ද්‍රවිඩයෝ ද අනාර්යයෝ වෙති. ඔවුන්ට ද බෙර වර්ග වේ. එහෙත් මේ බෙර වර්ග සිංහලයන්ගේ බෙර වර්ගවලට වඩා වෙනස් වෙයි. සිංහලයන්ගේ ඇතැම් බෙර වර්ග මෙරට සිටි යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් ලැබුණු බව පිළිගතහොත්, මෙයින් කියැවෙන්නේ ද්‍රවිඩයන් යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් පැවත නොඑන බව ය. මෙරටට අර්ධ වෛදිකයන් පැමිණීමට පෙර සිටි ජනවර්ග ද්‍රවිඩ වී ය යනුවෙන් කියැවෙන මිථ්‍යාව මේ කරුණ ඔස්සේ ද බිඳ දැමිය හැකි ය.

අර්ධ වෛදිකයන් මෙරටට පැමිණීමට පෙර ද්‍රවඩයන් මෙරට සිටි බව ඇත්තක් නම් සිංහලයන් ඒ ද්‍රවිඩයන්ගේ ද විවිධ බෙර වරග ලබාගත යුතු ව තිබිණි. එහෙත් සිංහලයන්ගේ බෙර අතර එවැනි ද්‍රවිඩ ලක්ෂණ ඇති බෙර වර්ග දක්නට නොලැබෙන්නේ ය යන්න නිවැරදි ප්‍රකාශයක් යැයි සිතමි. සිංහලයෝ මංගල අවස්ථාවල දී මෙන් ම අවමංගල අවස්ථාවල දී ද බෙර යොදා ගනිති. එහෙත් ඒ ඒ අවස්ථාවල දී නැගෙන බෙර හඬ හා රිද්ම එක ම නො වේ.

ආර්යයන් දඹදිවට පැමිණීමට පෙර තිබූ බෙර වර්ග ගැන මෙන් ම සිදුහත් කුමරු උපන් අවධියෙහි ශාක්‍යයන් අතර බෙර වර්ග වී නම් ඒ ගැන ද අධ්‍යයනයක් කළ යුතුව ඇත. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි බෙරයට වැදගත් තැනක් හිමි වී ඇත්තේ කෙසේ ද? පංසලට ද බෙරය ඇතුල් වී ඇත්තේ කෙසේ ද? යක්ෂ ගෝත්‍රිකයන් බුදුදහමට එතරම් ලැදි කමක් නොදැක්වූ බව රහසක් නො වේ. එහෙත් යක්ෂ ගෝත්‍රිකයන්ගේ බෙරය පංසලට ඇතුල් වී ඇත. එයට හේතුව කුමක් ද?

ඇතැම් විට අර්ධ වෛදික සංස්කෘතීන්හි බෙරය වාද්‍ය භාණ්ඩයක් ලෙස ප්‍රචලිත ව තිබීම නිසා බෞද්ධයන් වීමට පෙර සිංහලයන් අතර බෙර තිබෙන්නට ඇත. ඒ ඇතැම් බෙර දඹදිව යක්ෂ ගෝත්‍රිකයන් අතර ද තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය. එබැවින් සිංහලයන්ට අර්ධ වෛදිකයන්ගෙන් ද බෙර ලැබෙන්නට ඇත. කෙසේ වෙතත් මෙයින් කියැවෙන්නේ යක්ෂ ගෝත්‍රික බෙර ගැන සිංහලයන්ට අවබෝධයක් තිබූ බවත් ඒ තම සංස්කෘතියට අවශෝෂණය කරගැනීමට යක්ෂ ගෝත්‍රිකයන්ගේ බෞද්ධ විරෝධය ප්‍රශ්නයක් නොවන්නට ඇති බවත් ය.

යක්ෂ ගෝත්‍රිකයන්ගේ වැව් හා අදාළ තාක්ෂණය ලබා ගැනීමේ දී ද වෙනත් කලා ශිල්ප අවශෝෂණය කිරීමේ දී ද ඔවුන් බුදුදහමට දැක් වූ විරෝධතාව සිංහලයන්ට ප්‍රශ්නයක් වී ඇති බවක් නො පෙනෙයි. එබැවින් බෙරය තම සංස්කෘතියට අවශෝෂණය කිරීමේ දී ද සිංහලයන් ප්‍රශ්න ඇතිකරගෙන නැත. මෙහි දී කිවයුතු තවත් කරුණක් නම් අනුරාධපුර යුගයේ බෙර වයමින් නටන ශිල්පීන්ගේ පිළිරූ නෙළා ඇති බව ය. ඉසුරුමුණිය කෞතුකාගාරයේ එවැනි රූප දක්නට ඇත. වාමන රූප සමග බෙර දක්නට ලැබීමෙන් පැහැදිලි වන්නේ ඉන් නිරූපණය වන්නේ අර්ධ වෛදිකයන් මෙරටට පැමිණීමට පෙර සිටි යක්ෂ ගෝත්‍රකියන් වාමනයන් බව ද? යක්ෂ ගෝත්‍රිකයන් එතරම් උස් නොවූ ජනවර්ගයක් වී ද?

සිංහලයන්ට සංගීතයක් නොතිබිණි යැයි කියන ප්‍රබන්ධය ද එයට හේතුව බුදුදහම නච්ච ගීත වාදිත ආදියෙන් වැළකීමට අනුබල දීම යැයි ද ආදී කතා ද බෙර හා නැටුම් ආශ්‍රිත කලාවන්ගෙන් බොරු වෙයි. අනුරාධපුර යුගයේ නෙළා ඇති ඉහත කී පිළිම මගින් ද ඒ කතා බොරු වෙයි. සිංහලයන්ට සංගීතයක් නැතැයි යන කතාව නිර්මාණය කළෝ වත්මන් පඬියෝ ය. සමහර විට වෛදිකයන් ද මෙවැනි කතා එකල ගොතන්නට ඇත. සිංහල බෞද්ධ සංස්කෘතිය පැහැදිලිව ම වෛදික සංස්කෘතිය පිටු දකින සංස්කෘතියකි. අප විටින් විට පවසා ඇති පරිදි සිංහල බෞද්ධ සංස්කෘතිය වියුක්ත සංස්කෘතියක් නො වේ. ඒ හේතුවෙන් සංගීතය පිළිබඳ ව සංකේත යොදාගත් සාහිත්‍යයක් බිහි නොවන්නට ඇත. එසේත් නැතහොත් තිබූ වියුක්ත නොවූ පොත් වුව ද යටත්විජිතවාදීන් විසින් විශේෂයෙන් ම ලන්දේසීන් විසින් විනාශ කෙරෙන්නට ඇත.

© Prof. Nalin De Silva

සිංහල බෞද්ධ සංස්කෘතියට යක්ෂ ගෝත්‍රිකයන් මුල දී ආකර්ෂණය වී නැතත් සිංහල බෞද්ධ සංස්කෘතිය යක්ෂ සංස්කෘතිය පිටුපා දැක නැත. බොහෝ අවස්ථාවල දී සිංහලයන් විසින්, එනම් සිංහලයන් වූ අර්බ වෛදිකයන්, නාගයන්, දෙවියන් (දේව ගෝත්‍රිකයන්) හා වෙනත් ගෝත්‍රිකයන් විසින්, යක්ෂ සංස්කෘතිය ද තම සංස්කෘතියට අවශෝෂණය කරගෙන ඇති බව පැහැදිලි ය.

සිංහල බෞද්ධ සංස්කෘතියෙහි යක්ෂ ගෝත්‍රික හරයක් ඇත. අප කතාකරන බසෙහි ද සිරිත් විරිත්වල ද ඒ දක්නට හැකි ය. අශෝක බෞද්ධ සංස්කෘතිය මෙරට සිංහල සංස්කෘතියට අවශෝෂණය කිරීමෙන් සිංහල බෞද්ධ සංස්කෘතිය නිර්මාණය වී ඇත. එහෙත් ඒ අතර යක්ෂ ගෝත්‍රික සංරචකයක් ද සිංහල බෞද්ධ සංස්කෘතියෙහි වෙයි. යක්ෂ ගෝත්‍රික සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතියට සිංහලයන් බෞද්ධයන් වීමට පෙර මෙන් ම පසුව ද එකතුවන්නට ඇතැයි සිතිය හැකි ය.

පැහැදිලිව ම වැව හා ආශ්‍රිත සංස්කෘතිය යක්ෂ සංස්කෘතියෙන් සිංහල සංස්කෘතියට එක් වූ අංගයකි. එය සිංහල සංස්කෘතියට එකතුවී ඇත්තේ සිංහලයන් බෞද්ධයන් වීමට පළමුව ය. සිංහල සංගීතයට ද (වාදනය ද ඇතුලු) යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් බොහෝ දෑ සිංහලයන් බෞද්ධයන් වීමට පෙර එකතු වී ඇති බව ද කිව හැකි ය. එසේ ම සිංහලයන් බෞද්ධයන් වීමෙන් පසුව ද පස්වැනි සියවස දක්වා ම යක්ෂ ගෝත්‍රික සංස්කෘතියෙන් යම් යම් දෑ එකතුවන්නට ඇත. මෙරට පැවති බව දැන් තහවුරු වී ඇති වානේ කර්මාන්තය ද යක්ෂ සංස්කෘතියෙන් ලබාගත්තක් වීමට ඇති ඉඩ කඩ බොහෝ ය.

එහෙත් පස්වැනි සියවසේ සිංහල බෞද්ධ ඉතිහාසය ලියැවෙන විට යක්ෂ සංස්කෘතියෙන් ලබාගත් බොහෝ දේ අමතක කෙරී ඇත. එයට ප්‍රධාන හේතුව යක්ෂ ගෝත්‍රිකයන් බුදු දහමට දැක් වූ විරෝධාකල්පය විය යුතු ය. පස්වැනි සියවසේ දී ලියැවුණේ මෙරට ඉතිහාසය පමණක් නොවන බව අප කිහිප වතාවක් ම කියා ඇත. එදා සිට පෘතුගීසීන් පැමිණෙන තෙක් අපේ අනාගතය ද ලියැ වී ඇත්තේ එකල ය. පස්වැනි සියවස අග දී මුගලන් රජු රජ වී ඇත්තේ යක්ෂ ගෝත්‍රික බලය මුළුමනින් ම මෙන් බිඳ දමමිනි. ඉන්පසු සිංලයන්ට යක්ෂ සංස්කෘතියෙන් ලබාගැනීමට එතරම් දෙයක් තිබිණි යැයි සිතිය නො හැකි ය. එමෙන් ම ඉන්පසු සිංහලයන් යක්ෂ ගෝත්‍රික සංස්කෘතියෙන් කිසිවක් ලබාගැනීමට එතරම් වුවමනාවක් දක්වන්නට නැත.

පඬුඅබා රජු දවස සිංහල ජාතිය නිර්මාණය කිරීමේ කටයුත්ත ඇරඹීමෙන් පසුව යක්ෂ ගෝත්‍රිකයන්ගේ ස්වර්ණමය යුගය වූයේ පස්වැනි සියවසට ආසන්න කාලය යැයි කිව හැකි ය. ධාතුසේන රජුගේ ප්‍රධාන බිසොවගේ පුතා ලෙස සැලකිය හැකි මුගලන් කුමරුට භාරතීය රජවරුන්ගේ සහාය ලැබී තිබේ. එහෙත් ඔහුට මෙරට පළල් ජනතාවගේ සහාය තිබී නැත. ජනතාව සහාය දී ඇත්තේ කාශ්‍යප රජුට ය. මුගලන් කුමරු සිටිය දී ම මහාවංසයේ ඇසින් පියා මැරූ කාශ්‍යප රජුට රජකම හිමිවීමට නම් රටේ විශාල දේශපාලනික වෙනස්කම් ඇතිවී තිබිය යුතු ය. යක්ෂ ගෝත්‍රිකයන් මේ වන විට ශක්තිමත් වී ජනතාව ආකර්ෂණය කරගැනීමට සමත් වී ඇත. ඒ වන විට මහසෙන් යුගයට ද වඩා යක්ෂ ගෝත්‍රිකයන්ගේ ශක්තිය වැඩි වී තිබෙන්නට ඇත.

මහාවිහාරයට යක්ෂ ගෝත්‍රිකයන් කිසි දිනෙක එතරම් කැමැත්තක් දක්වන්නට ඇතැයි සිතිය නො හැකි ය. අප සාකච්ඡාවට භාජනය වන යුගයෙහි මහාවිහාරය ගැන තවත් කලකිරෙන්නට ඇත්තේ පොතපත පාළියෙන් ලිවීම නිසා ය. මහාවිහාරික භික්ෂූන් වහන්සේ එසේ පාළි හෙවත් පෙළ බසින් පොත් ලියුවෙත් හෙළයෙන් තිබූ පොත් පාළියට පරිවර්තනය කෙළේත් බුදුදහමේ චිරස්ථිතිය උදෙසා වුවත් යක්ෂ ගෝත්‍රිකයන් ඒ දකින්නට ඇත්තේ දඹදිවට තම අනන්‍යතාව පාවාදීමක් ලෙස ය. ඒ සියල්ල මැද මහාවිහාරයට හා අර්බ වෛදිකයනට විරුද්ධව ජනතාව පෙළ ගැස්වීමට යක්ෂ ගෝත්‍රිකයන්ට එතෙක් ඉතිහාසයේ කෙදිනකටත් වඩා අවස්ථාවක් ලැබෙන්නට ඇත.

ධාතුසේන රජු දාඨිය පීඨිය ආදී ද්‍රවිඩ රජවරුන්ට විරුද්ධව යුද්ධ කර ජයගත්ත ද, කලාවැව අවුකන පිළිම වහන්සේ නිර්මාණය කළ ද ඒ රජුට ජනතා ප්‍රසාදය දිනාගැනීමට නොහැකි වී ඇත. ඒ රජු ජනතා ප්‍රසාදය දිනා සිටියේ නම් ඔහුගේ පුතකුට ඔහු මරා රජකම ලබාගැනීම පහසු නොවනු ඇත. එමෙන් ම එවැනි තත්වයක් යටතේ රජුගේ මෙන් ම මහාවිහාරයේ ද කැමැත්ත දිනා සිටි මුගලන් කුමරුට කාශ්‍යප රජුට එරෙහි ව සේනා සංවිධානය කිරීමට දඹදිවට පැන යෑමට සිදු වන්නේත් නැත. එබැවින් ධාතුසේන රජු ජනතාව අතර අප්‍රසාදයට පත්ව සිටින්නට ඇතැයි යන නිගමනයට එළඹෙන්නට අපට සිදුවෙයි.

© Prof. Nalin De Silva

එහෙත් එයට හේතුව කුමක් දැයි අපි නො දනිමු. මහාවංසයෙන් ඒ හේතුව කුමක් දැයි සොයාගැනීමට ද නො හැකි ය. අපට ඒ සඳහා ඇති එකම හෝඩුවාව කාශ්‍යප කුමරු ධාතුසේන රජුගෙන් වස්තුව ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීම ය. එය හුදෙක් පුතකු තම පියාගෙන් වස්තුව ඉල්ලීමක් පමණක් ද? රජුගේ වස්තුව ඇත්තේ කොතැනක දැයි දැනගැනීමට යක්ෂ ගෝත්‍රිකයන්ට මෙන් ම අනෙක් ජනයාට ද අවශ්‍ය විණි ද? කාශ්‍යප කුමරු කෙළේ ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වීම පමණක් ද?

ඒ ප්‍රශ්නවලට පිළිතුරු අපි නො දනිමු. ඒ ප්‍රශ්න මෙතෙක් මෙරට ඉතිහාසඥයකු නගා ඇත්තේ දැයි නො දනිමි. ඉතිහාසඥයකු නොවන මට ඉතිහාසය ගැන ඇත්තේ උනන්දුවක් හා කුතුහලයකි. ඇතැම් විට ඒ ප්‍රශ්නවලට කිසිම පදනමක් නොමැති වන්නට ද හැකි ය. එහෙත් දැනුම නිර්මාණය වන්නේ ප්‍රශ්න කිරීමෙන් පමණකි. කලාවැව යක්ෂ ගෝත්‍රිකයන්ගේ වැව් තාක්ෂණයට පිටින් ගොස් නිර්මාණය කරන ලද්දකි. එය එක්තරා අයුරකින් ගත්කල මෙරට සංස්කෘතියට පටහැණි විය. අවුකන පිළිම වහන්සේ අද අපට සමීප නමුත් එතෙක් නිර්මාණය කර තිබූ පිළිම වහන්සේලාට වඩා වෙනස් විය. රජු මෙරට සංස්කෘතියට පිටුපාන බව ජනතාවට හා කාශ්‍යප කුමරුන්ට එත්තු ගැන්වීමට යක්ෂ ගෝත්‍රික ප්‍රධානීන්ට හැකිවිණි ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva